

# දිළිඳුකම හා වන විනාශය

***"ලෝකයේ වර්තමාන ජනසංඛ්‍යා ප්‍රමාණය බිලියන 6 ඉක්මවා සිටී. එයින් 3/4 කට ආසන්න ප්‍රමාණයක් වාසය කරන්නේ දියුණු වෙමින් පවත්නා රටවලයි. එක්සත් ජාතීන්ගේ වර්ගීකරණයට අනුව ලොව අඩුම සංවර්ධිත මට්ටමක් පෙන්වන රටවල් 44 ක් පවතින බව දක්වා තිබේ."***

දිළිඳුකම නැතහොත් දරිද්‍රතාව (Poverty) යන්න නිර්වචනය කිරීමට විවිධ විද්වතුන් විවිධාකාරයෙන් උත්සාහ දරා ඇත. මුල් අවධියේ ආදායම පදනම් කොටගෙන දිළිඳුකම අර්ථ කථනය කොට ඇත. පසුකාලයේ එවැනි නිර්ණායක වල පවත්නා දුර්වලතා හඳුනාගෙන වඩාත් පුළුල් අරුතක් දෙන අයුරින්, මිනිසුන්ට 'ශීලාචාර සම්පන්න ජීවිතයක්' (Decent Life) ගතකිරීමට අවශ්‍යකරන අවම තත්ත්වයන්වත් නොමැතිවීම 'දරිද්‍රතාවය' ලෙස නිර්වචනය කරන ලදී. මෙහිදී 'ශීලාචාර සම්පන්න ජීවිතය' යන්න ලොව පවත්නා සෑම සමාජයකටම ඒකාකාරී විය නොහැක. එය විවිධ සංස්කෘතිකමය, සමාජීය හෝ වෙනත් සාධක වලට අනුකූලව වෙනස් වීමට පිළිවන. ඉතාමත් සරලව ගතහොත් මනුෂ්‍ය ජීවිතය පවත්වාගෙන යාම පිණිස අත්‍යවශ්‍ය ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම්, අධ්‍යාපනය, සෞඛ්‍ය, පානීය ජලය වැනි මූලිකාංග යථා පරිදි නොලැබේ නම් ඔහු හෝ ඇය නැතහොත් එම ජන කණ්ඩායම දරිද්‍රතාවයෙන් පෙළෙන කොටසක් ලෙසට හඳුනාගත හැකිය. කෙසේ වෙතත් දිළින්දන් හඳුනා ගැනීම පිණිස භාවිතා කළහැකි මිනුම් අතුරින් ඒක පුද්ගල කැලරි පරිභෝජන මට්ටමට වැදගත් තැනක් හිමිවේ. ඒ අනුව ඕනෑම වැඩිහිටි පුද්ගලයෙකු දෛනිකව ලබාගන්නා ආහාරවල අඩංගු කැලරි ප්‍රමාණය 2500 ට අඩුනම් දිළින්දන් ලෙසට හඳුනා ගැනීමට පුළුවන.

ලෝකයේ වර්තමාන ජනසංඛ්‍යා ප්‍රමාණය බිලියන 6 ඉක්මවා සිටී. එයින් 3/4 කට ආසන්න ප්‍රමාණයක් වාසය කරන්නේ දියුණු වෙමින් පවත්නා රටවලයි. එක්සත් ජාතීන්ගේ වර්ගීකරණයට අනුව ලොව අඩුම සංවර්ධිත මට්ටමක් පෙන්වන රටවල් 44 ක් පවතින බව දක්වා තිබේ. සමස්තයක් වශයෙන් ගත්කල සංවර්ධනය වෙමින් පවතින රටවල ජනසංඛ්‍යා වර්ධන වේගය තවමත් ඉහළ මට්ටමක පවතී. ලෝකයේ වර්තමාන ජනසංඛ්‍යා වර්ධන වේගය 2% ක් ලෙසට සළකතොත් සෑම තත්පරයකටම බිළිඳුන් දෙදෙනෙකු පමණ මෙලොව එළිය දකී. ඒ අනුව, මිනිත්තුවකදී ඒ ප්‍රමාණය 142 ක්ද, පැයකදී 8533 ක්ද, දිනකදී 204,840 ක්ද, වසරකදී මිලියන 78 ක්ද වශයෙන් ලෝක ජන සංඛ්‍යාවට එකතුවන බව සාමාන්‍ය කරණය කළ හැකිය. මෙලෙස එකතුවන ජනයාගෙන් අති බහුතරය සංවර්ධනය වෙමින් පවතින රටවලින් වීම මෙහි ඇති ප්‍රධානම ලක්ෂණයයි. එම රටවල ජනතාවගෙන් විශාල ප්‍රමාණයක් දිළින්දන් ලෙසට ජීවත් වේ. 90 දශකයේ මුල් භාගයේ ලෝක ජනසංඛ්‍යාවෙන් බිලියන 1.25 ක් නැතහොත් ලෝක ප්‍රජාවගෙන් 23% ක් පමණ එම ප්‍රමාණය සමස්තයක් ලෙසට සළකා බලතොත් අප්‍රිකානු රටවල 54% ක්ද ආසියාවේ 23% ක්ද, ලතින් ඇමරිකාවේ 39% ක්ද, වශයෙන් දිළින්දන් ජීවත්වන බව ගණනය කොට තිබේ. මෙයින් පෙනී යන්නේ දිළින්දන්ගෙන් විශාල ප්‍රමාණයක් දියුණු වෙමින් පවත්නා රටවල වාසය කරන බවයි.

ස්වාභාවික පරිසරය, විශේෂයෙන්ම ස්වාභාවික වනාන්තර විනාශවී යාම අද ලෝකය හමුවේ පවත්නා ප්‍රධාන ගැටළුවකි. ස්වාභාවික පැවැත්මට අහිතකර සාධක කීපයක් පෙන්වා දීමට පිළිවන. ඒවානම් 1. ස්වාභාවික හේතු 2. රාජ්‍ය මැදිහත් වීමකින් යුක්තව සිදුකෙරෙන ක්‍රියාකාරකම්, 3. නීති විරෝධී අයුරින් ක්‍රියාකරන්නන් සහ 4. දිළින්දන්ගේ ක්‍රියාකාරකම් වශයෙනි. මෙයින් ස්වභාවිකව සිදුවන ලැව්ගිනි වැනි හේතු මගින් සිදුවන හානිවල වගකීම කිසිවෙකුට පැවරීම අසීරුවුවත්, ඒවා මගින් සිදුවන හානිය අවම කරගැනීම සඳහා උපක්‍රම යෙදීමට පිළිවන. එසේම ඇතැම් රටවල ඍජුවම රජයේ මැදිහත් වීමෙන්, එසේත් නැතහොත් පෞද්ගලික අංශයට වන සම්පත් විකුණා දැමීම, බදුදීම හෝ අයිතිය පැවරීමේ විවිධ ක්‍රමෝපායයන් මගින් කැලෑ කැපීම සිදුකෙරේ. මැලේසියාව මීට හොඳම නිදසුනකි. නීති විරෝධී අයුරින් සහ ව්‍යාපාරික මට්ටමින් වන සම්පත් භුක්ති විඳීමේ රටාවක්ද බොහෝ රටවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. ඉහත දක්වූ පාර්ශ්වයන් දෙකම මගින් ඉවක් බවක් නැතිව සිදුකරන පරිසර හානිය අතිවිශාලය. එහෙත් මෙම ලිපියෙන් අවධාරණය කරනුයේ දිළින්දන්ගේ ඍජු හෝ වක්‍ර ක්‍රියාකාරකම් ස්වාභාවික පරිසරයට, විශේෂයෙන්ම වන සම්පත්වලට බලපාන ආකාරය පිළිබඳව පරීක්ෂා කිරීමටත්, එයින් මිනිසා ප්‍රධාන ජෛව

ප්‍රජාවට කෙබඳු බලපෑමක් ඇතිවිය හැකිද යන්න පිළිබඳව අවධානය යොමු කිරීමත්ය.

දිනෙන් දින ලෝක ජන සංඛ්‍යාවට එකතුවන ජනසංඛ්‍යා ප්‍රමාණය, විශේෂයෙන්ම දිළින්දන්ගේ ප්‍රමාණය වැඩිවෙමින් පවතී. ජනසංඛ්‍යා ප්‍රමාණය වැඩිවීම ඕනෑම රටක සමාජ ආර්ථික සහ දේශපාලනමය ගැටළු රාශියක් ජනිත කිරීමට හේතුවේ. වැඩිවන ජනයාට අවශ්‍ය කරන ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් වැනි මූලික අවශ්‍යතා සැපිරීම දියුණුවෙමින් පවත්නා සෑම රටක්ම මුහුණපා ඇති දවැන්ත අභියෝගයකි. ආහාර නිෂ්පාදනය කිරීම එකී අභියෝග අතර ප්‍රමුඛස්ථානයේ සිටී. ලොව බොහෝ රටවල් විසින් ආහාර නිෂ්පාදනය නංවාලීම සඳහා යොදගෙන තිබූ ප්‍රවේශ මාර්ග අතුරින් කෘෂිකර්මයට විශාල වශයෙන් භූමිය යොද ගැනීමේ උපක්‍රමයට (Extensive Cultivation) හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙම ක්‍රියාදමයේදී මූලික වශයෙන් අවධානය යොමුවන්නේ කෘෂිකර්මාන්තයට යොදගෙන නොමැති භූමිය වෙතටයි. විශේෂයෙන්ම කෘෂිකර්මාන්තයට හිතකර එහෙත් වගාවට යොදගෙන නොමැති වනාන්තර සහ තෘණබිම් දෙසට නිතැතින්ම අවධානය යොමුවේ. ඒ අනුව පවත්නා වනාන්තර ඉවත්කොට ඒවා කෘෂි බිම් බවට පත්කිරීම ඉතාමත් ජනප්‍රිය ක්‍රමයක් බවට පත්වී තිබුණි.

ලෝකයේ පවත්නා මුළු බිම් ප්‍රමාණය වන හෙක්ටයාර් බිලියන 13න් වනාන්තර ව්‍යාප්තව ඇත්තේ බිලියන හතරක් නැතහොත් මුළු ලෝක බිම් ප්‍රමාණයෙන් 30% කට ආසන්න ප්‍රමාණයකයි. එයින්ද දිළින්දන් විශාල ප්‍රමාණයක් වාසය කරන සර්ම කලාපයේ වාර්ෂිකව හෙක්ටයාර් මිලියන 8-10 ත් අතර ප්‍රමාණයක් විවිධ මානව ක්‍රියාකාරකම් නිසා එළි කරනු ලැබේ. මෙම සීඝ්‍රතාවට සාපේක්ෂව තවදුරටත් වනාන්තර එළි කරනු ලැබුවහොත් තවත් දශක කීපයකදී දනට ඉතිරිව පවත්නා වනාන්තර ප්‍රමාණයත් මෙලෙසින් සදහටම තුරන්වීමට ඉඩ තිබේ. නිදසුනක් ලෙසට 1981 - 85 කාලය තුළ දකුණු ආසියාවේ වනාන්තර වලින් හෙක්ටයාර් 308,000 ක් පමණ එළිකර තිබූ අතර 1985 -90 තුළදී එම ප්‍රමාණය තව දුරටත් හෙක්ටයාර් 400,000 දක්වා වර්ධනය වී ඇත. ශ්‍රී ලංකාවේද මීට සමාන තත්ත්වයක් පවතින බව පෙනේ. මෙරට ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ප්‍රවේශ මාර්ග යටතේ වියළි කලාපීය ගොවිජනපද ඇතිකිරීම, විශාල ජලාශ ඇතිකිරීම මෙන්ම වතු වගාව, හේන් ගොවිතැන ඇතුළු විවිධ ක්‍රියාකාරකම් නිසා අපරටෙහි ස්වභාවික වනාන්තර ප්‍රමාණයද සීඝ්‍රයෙන් අඩුවෙමින් පවතී. 1900 දී දිවයිනෙන් 70% ක් වූ මුළු වනාන්තර ප්‍රමාණය 1953 වන විට 50% දක්වා අඩුවී ඇත (Somasekara 1989). වර්තමානයේ ඒ ප්‍රමාණය 22% ක් දක්වා වූ මට්ටමක් දක්වා තවදුරටත් අඩුවී



ඡායාරූප: ජෛව විවිධත්ව අංශයේ අනුග්‍රහයෙනි.

හේන් ගොවිතැන : වන විනාශය සහ දිළිඳුකම අත්වැල් බැඳ ගනිමින්........





ඇතිබව ඇස්තමේන්තු කොට ඇත. කෙසේ වෙතත් Repetto (1989) ගණනය කොට ඇති අන්දමට 1981 - 1985 කාලය තුළ ශ්‍රී ලංකාවේ හෙක්ටයාර් 58,000 ක් පමණ වනාන්තර විනාශවී ඇති අතර වාර්ෂිකව සාමාන්‍යයෙන් 2.1% ක වේගයෙන් වනාන්තර විනාශවී ඇතිබව දක්වා තිබේ. තුන්වන ලෝකයේ රටවල ජීවත් වන්නන්ගෙන් බහුතරයකගේ ප්‍රධාන ඉන්ධන මූලාශ්‍රය ලෙසට තවමත් වැදගත් වී ඇත්තේ දවයි. විශේෂයෙන් දකුණු අප්‍රිකානු රටවල වැසියන්ගේ බලශක්ති පරිභෝජනයෙන් 50% ත් 90% ත් අතර ප්‍රමාණයක දයකත්වයක් හිමිව ඇත්තේ දව වලටයි. ඔවුන්ගේ දෛනික ආහාර පිළියෙල කර ගැනීම සහ වෙනත් අවශ්‍යතා සඳහාත් දව භාවිතා කරයි. මෙලෙස වාර්ෂිකව වර්ග කිලෝමීටර් 25,000 ක පමණ ව්‍යාප්තවී ඇති වනාන්තර ලෝක ප්‍රජාව විසින් දව වශයෙන් කපාගන්නා බව 1979 දී Myers විසින් ගණනය කොට තිබේ. එසේ කපාගන්නා දව ප්‍රමාණය සෑම වසරකම ඒකාකාරී නොවන බවත් එය කාලීනව වෙනස් වන බවත් ඔහු විසින් දක්වා තිබේ. නිදසුනක් ලෙස 1950 දී එලෙස වනාන්තර වලින් දව ලෙසට කපාගත් ප්‍රමාණය 1973 වන විට දෙගුණ වී ඇති බවද දක්වා තිබේ. කෙසේ වෙතත් මේ වනවිට බිලියන 3 කට පමණ ප්‍රමාණවත් දර ප්‍රමාණයක් නොලැබෙන බව ගණනය කොට තිබේ.

දියුණු වෙමින් පවත්නා රටවල ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් සේවා වියුක්තව සිටී. එමෙන්ම තවත් විශාල පිරිසක් තම රැකියාවෙන් උපයාගන්නා වේතනය තම පවුලේ වියදමටවත් ප්‍රමාණවත් නොවන මට්ටමක සිටී. තමාට හෝ තම පවුලේ පැවැත්මට අවශ්‍ය දෛනික වියදම් සොයාගැනීමට අසීරුවූ කල ඔහු කෙසේ හෝ තම අභිප්‍රාය ඉටුකර ගැනීමට වෙර දරයි. එහිදී ඔවුන් විවිධවූ සමාජ විරෝධී ක්‍රියාවන් කෙරේ යොමු වෙමින් පවතී. ඒ අතර දව වෙළඳාමට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. දියුණු වෙමින් පවත්නා වූ රටවල මුදල් උපයා ගැනීමේ පහසු මාර්ගයක් ලෙසට දව වෙළඳාම මෑත කාලයේ ඉතා ජනප්‍රිය මාර්ගයක් බවට පත්ව ඇත. දව කඳන්, ඉරා සකස්කළ දව හෝ ගෘහ භාණ්ඩ වශයෙන් වෙළඳපෙළට සැපයීමෙන් ඉතා ඉහළ මිලක් ලබා ගැනීමේ හැකියාව පවතී. මේ තත්ත්වය මත තමන්ගේ ඉඩමෙහි පවත්නාවූ වෘක්ෂ කපා අළෙවි කිරීමත්, කැලෑ වලින් විශාල වශයෙන් දව කැපීමත් නිරන්තරයෙන්ම සිදුවේ. එපමණක් නොව රක්ෂිත බිම්වල අනවසරයෙන් පදිංචිවීම, ඒවා හේන් ගොවිතැන වැනි විවිධ භූමි පරිභෝග ක්‍රම දක්වා පරිවර්තනය කිරීමත් දැකීමට පිළිවන. වන රක්ෂිත, ගංගා පෝෂක ප්‍රදේශ එළිකිරීම වැනි විවිධ පාරිසරික ගැටළු ඇතිකිරීමට හේතුවිය හැක. ඒවා තුළින් කෙටිකාලීන සහ දිගුකාලීන පාරිසරික අර්බුද ඇතිවිය හැක. පාංශු කලාප නිරාවරණය වී සාරවත්බව ගිලිහී යාම, පෘථිවි ඇල්බිඩෝව වෙනස්වීම තුළින් දේශගුණික විපර්යාස ඇතිවීම වැනි උග්‍ර පාරිසරික අර්බුද ඇතිවිය හැක.

ලෝකයේ අර්ධ ශුෂ්ක ප්‍රදේශවල වෙසෙන දිළිඳු ජනයාගේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් සත්ව පාලනය මත රඳා පවතී. මොවුන්ගේ ජනසංඛ්‍යා වර්ධනයට සාපේක්ෂව ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් ලෙසට පවත්වාගෙන යාමට උත්සාහ කරයි. එහි අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ තෘණ බිම් විශාල ප්‍රමාණයක් විනාශ වී යාමයි. තෘණබිම් හිඟවීමට සාපේක්ෂව මොවුන් තවදුරටත් වනාන්තර ප්‍රදේශ කරා සංක්‍රමණය වීමක් දක්නට ලැබේ. එය වනාන්තරවල පැවැත්මට තර්ජනයකි. වනාන්තරවල පැවැත්මට සමස්ත ජෛව ප්‍රජාවම මහෝපකාරී වේ. ප්‍රධාන වශයෙන්ම ශාක මගින් සිදුකරන ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. ඒ තුළින් සත්වයින් විසින් ප්‍රශ්වාස කරන අපිරිසිදු කාබන්ඩයොක්සයිඩ් වායුව පිරිසිදු කරන පිරිපහදුවක් ලෙසට ශාක ප්‍රජාව ක්‍රියාත්මක වන බව පැහැදිලි වේ. එමෙන්ම ලොව වසන සියළු සත්ව හා ශාක පැවැත්මට ඉවහල් වන ඇතැම් චක්‍රීය පාරිසරික ක්‍රියාවන් වලට ශාක ප්‍රජාව විනාශවී යාම අහිතකර අන්දමින් බලපෑ හැක. විශේෂයෙන්ම නයිට්‍රජන් චක්‍රය, කාබන් චක්‍රය, ජල චක්‍රය වැනි චක්‍රීය ක්‍රියාකාරකම් වල පැවැත්ම අඩාල නොකිරීමට සැමගේ අවධානය යොමුවිය යුතුය.

මෙම තත්ත්වයන් දෙස බැලූ කල පෙනී යන්නේ මානවයාගේ පැවැත්ම සඳහා පරිසරයෙන් වනයෙන් සිදුවන මෙහෙය අති විශාල බවයි. සමස්ත ජෛව ප්‍රජාවේම පැවැත්මට වනාන්තර වලින් සුවිශේෂ කාර්යභාරයක් ඉටු වේ. දිළිඳු ජනයා ඇතුළු අනෙක් සියළු පාර්ශ්වයන් විසින් අඛණ්ඩව සිදුකරන වන විනාශය පාලනය කිරීමට සුදුසු කාලය එළඹ ඇත. දව මිනිසාට අත්‍යවශ්‍ය සම්පතකි. ඊට ඇත්තේද තරමක් දුරට අනම්‍ය ඉල්ලුමක් මුත් පවත්නා සැපයුම ස්ථාවර මට්ටමක කිසිසේත්ම නොපවතී. අනෙක් අතට වනාන්තර ක්ෂයවන සම්පතක් නොවුනද ඒවා නැවත ඇතිවීමට සෑහෙන කාලයක් ගත වේ.



ඡායාරූප: අරුණ එස්. අතුකෝරළ

පේරාදෙණි උද්භිද උයන: තණ පළසක් මත නැගි දැවැන්තයෙක් ...

සාමාන්‍යයෙන් ගසක් හොඳින් වැඩීමට වසර 20-40 කාලයක් ගතවිය හැක. එහෙත් කෙටිකාලීනව වර්ධනය වන වෘක්ෂයන් පවතී. ලෝකයේ සිදුවන වන සංහාරය හැකිතාක් දුරට අඩපණ කර ඊට සාපේක්ෂව කඩිනමින් වන වගාව ආරම්භ කළ යුතුය. මේ සම්බන්ධයෙන් දනටමත් ලෝකයේ බොහෝ රටවල් විසින් විවිධ වන වගා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ඒවා අතර ප්‍රජා වන වගාවට පෞද්ගලික අංශය හවුල්කර ගැනීම වැනි ඒවා දක්විය හැකිය. එහෙත් මෙම ක්‍රියාවලි තව දුරටත් පුළුල් ලෙසටත් කඩිනම් ලෙසටත් පවත්වාගෙන යාම යුගයේ අවශ්‍යතාවයකි. මේ ක්‍රියාදමයන්ට සාපේක්ෂව පවත්නා වන සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් සහ මනා කළමනාකාරිත්වයකින් යුක්තව ප්‍රයෝජනයට ගැනීමට වග බලා ගත යුතුය.

උක්ත ක්‍රියාදම සියල්ල ඒ ආකාරයෙන් සිදු වුවත්, වත්මන් අර්බුදය පාලනය කිරීමට කිසිවෙකු සමත් වෙතැයි සිතීම අසීරු කරුණකි. ඊට හේතුව වන සම්පතට හානි පමුණුවන පාර්ශ්වයන් එකී කාර්යයන්ගෙන් වළකාලීමට කටයුතු නොකිරීමයි. මෙහිදී දිළින්දන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කර ඔවුන් වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තකට දයක කර ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වේ. රැකියා විරහිත වූවන්ට රජයේ, පෞද්ගලික හෝ ස්වයං රැකියා සඳහා ඉඩප්‍රස්ථා සලසාදීම ඉතා වැදගත් කාර්යයකි. මේ සඳහා රාජ්‍ය අංශයේ සෘජු දයකත්වය ලබාදීමට අසීරු වන්නේ නම් පෞද්ගලික අංශය ඒ සඳහා පෙළඹවීමට නම්‍යශීලී ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම ඵලදායී විය හැක. එමෙන්ම ඉඩම් නොමැති දුගී දුප්පතුන්ට ඉඩම් බෙදදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද වඩාත් වැදගත් උපාය මාර්ගයකි. ඒ තුළින් ඔවුනට විවිධ භූමි පරිභෝග ක්‍රම අනුගමනය කිරීම තුළින් ආර්ථික අවස්ථා සපයා ගැනීමට හැකිවනු ඇත.

සමස්තයක් ලෙසට ගත් කල දිළිඳුකම සහ වන විනාශය අතර එක්තරා ආකාරයක සබඳතාවක් පවත්නා බව දක්වීමට පිළිවන. එම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා දිළිඳුකම, දිළින්දන් සහ දිළින්දන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීමට සිදු වනු ඇත. මෙහිදී වන විනාශයට වගකිවයුතු වන්නේ දිළින්දන් පමණක් නොවන බව දැඩිසේ අවධාරණය කළ යුතු අතර අනෙකුත් පාර්ශ්වයන්ගේ ක්‍රියාකාරකම් මැනවින් අධ්‍යයනය කර ප්‍රතිපත්ති සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම තුළින් වන විනාශය නවතා දැමීම කෙසේ වෙතත් කිසියම් පාලනයකට, යටත් කිරීමකට ලක්කළ හැකිවනු ඇත.

**ආර්.කේ. එල්. මර්වින් ධර්මසිරි**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**කැලණිය විශ්ව විද්‍යාලය**

